# පරිසර සංචාරයෙන් ඔබ්බට........

පුරාවිද්‍යාත්මක සාධක මත පදනම්ව තිබූ සංචාරක කර්මාන්තය වර්තමානය වන විට කැපී පෙණෙන වෙනසක් සිදු කරමින් පරිසර සංචාරක කර්මාන්තය බවට වෙනස් වෙමින් පවතී. පරිසර සංචාරක කර්මාන්තයේ ආරම්භය පිළිබඳ විවිධ මත පැවතියත් එහි ආරම්භ අතීතයේ දේශ සංචාරයේ යෙදුනු දේශ ගවේෂකයන් වීමට බොහෝ ඉඩකඩ ඇත. මුහුදු වෙරළ, හිරු එළිය අතීතයේ පටන් සංචාරකයන්ගේ අවධානයට ලක්වූ සාධක වූ අතර අතීත නටබුන් නැරඹීම ද එම සංචාරයේම තවත් අංගයක් විය.

සමාජ වෙනස්කම් සමඟ විද්‍යා හා ආර්ථික දියුණුව අතර සිරවූ මිනිසා තමනට අවැසි මානසික නිදහස ලබාගැනිමට තෝරාගත්තේ පරිසරයේ ආශ්වාදය අත් විඳීමය. දියුණු ලෝකයේ පරිසරය බොහෝ දුරට වැනසී අවසන් බැවින් මේ ආශ්වාදය විඳ ගැනීමට පරිසර සංචාරයේ යෙදීමට අද ඔවුනට සිදුව ඇත. පරිසරයේ පහස විඳිමින් වගකීමෙන් යුතුව සිදුකරන සංචාරය සරලව පරිසර සංචාරය ලෙස හැඳින්විය හැක. මෙහි වැදගත් ලක්‍ෂණ වන්නේ,

* සංචාරක කර්මාන්තයෙන් පරිසරයේ පැවැත්මට හා සමතුලිතතාවයට හානි සිදු නොවීම.

* පරිසරයේ සැඟවුණු සුන්දරත්වය සංචාරකයන්ට අත්විඳීමට සැලසීම.

* අදාල ප්‍රදේශයේ හෝ කලාපයේ සංස්කෘතික විවිධත්වය අධ්‍යයනයට ද අවස්ථා සැලසීම.

* ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීම ආදියයි.

පරිසර සංචාරක කර්මාන්තය වර්තමානය වන විට ඉතාමත් පුළුල් අන්දමින් ව්‍යාප්තවී ඇති අතර එහිදී විශේෂයෙන්ම ස්වභාවික වනාන්තර සපිරි එසේම ජෛව විවිධත්වයෙන් අනූන නිවර්තන කලාපයේ රටවල් සඳහා වැඩි අවධානයක් යොමුව ඇත. පරිසර සංචාරක කර්මාන්තය තුළ ප්‍රධාන වශයෙන්ම පක්ෂීන් නැරඹීම, වනගත චාරිකා, කඳු නැගීම, දුර්ග මාර්ග හරහා පාපැදි චාරිකා, බෝට්ටු සවාරි ආදිය ඉතාමත් ජනප්‍රිය අංගයන්ය.

සංචාරකයින් වැඩිපුර ගැවසෙන ස්ථානයන්හි (උදා:ජාතික වනෝද්‍යාන) සංචාරය නිසා ඇති වන පීඩනය අඩු කර ගැනීමට ඉහත අංගයන්ගෙන් සමන්විත සංචාරය ඉතාමත් වැදගත්ය. එසේම දිගු ඉතිහාසයකට හිමිකම් කියන අප සංස්කෘතිය මෙන්ම සංස්කෘතික විවිධත්වයද පරිසර සංචාරක කර්මාන්තයට දායක කරගත යුතු වැදගත් අංගයකි. යටත්විජිතවාදයට නතු වූ රටක් වශයෙන් අප සතුව පවතින සංස්කෘතික විවිධත්වය කාලයේ වැලිතලාවට යටවූ අතීත ස්මාරකයන් සංචාරකයන්ට අත්විඳීමට සහ අධ්‍යයනයට අපූර්ව විෂයකි. මෙය තාමත් වැඩි අවධානයකට ලක් නොවීම කණගාටුවට කරුණකි.

පරිසර සංචාරයේ සීමාව ඉක්මවීමට පෙර එය වඩාත් පැතිරුණු විෂය ක්ෂෙත්‍ර ආවරණය වන පරිදි ව්‍යාප්ත කිරීම අනාගත අයෝජනයක් වන්නේය. ශ්‍රී ලාංකීය සංස්කෘතික විවිධත්වය තුළ ගෘහ නිර්මාණ ශිල්පය, ගෘහ කර්මාන්ත, විවිධ පැරණි ආහාර ඇති සංස්කෘතික අංග රාශියක් අඩංගුය.

නවතම සංකල්ප වශයෙන් බිහිවන හරිත නගර වැඩ සටහන, පරිසර ගම්මාන වැඩ සටහන ආදිය මඟින් සංස්කෘතික විවිධත්වය පරිසර සංචාරක කර්මාන්තයට සම්බන්ධ කරවීමට වැඩි විභවයක් ඇති අතර ඒ සඳහා අවධානය යොමුව පැවතීම ප්‍රශංසනීය කරුණකි.

පරිසර සංචාරක කර්මාන්තයට නව මං සොයාගැනීම එහි ප්‍රවර්ධනයට හේතුවනවා මෙන්ම ග්‍රාමීය ආර්ථික සංවර්ධනයටද සෘජුවම අත්වැලක් වේ.

සමාජයෙන් ක්‍රමයෙන් ඉවත් වන සංස්කෘතික දායාදයන් මෙන්ම ඒ හා බැඳුනු පාරම්පරික දැනුම ද අනාගත පරම්පරාවන් සඳහා පාරිසරික සංචාරක කර්මාන්තයට දායක කර ගැනීම අප සැමගේම වගකීමකි.

ටී. එම්. අනුරුද්ධ තෙන්නකෝන්
අජිත් සිල්වා
ජෛව විවිධත්ව අංශය.

